ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු, කාර්යභාරය, මුදල් සහ බැංකු

W H මහේෂ් කුමාර
ප්‍රාදේශීය කළමණාකරු
මාතර ප්‍රාදේශීය කාර්යාලය
ශ්‍රී ලංකා මහ බැංකුව

පෙළගැස්ම

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉතිහාසය, විකාශනය සහ අරමුණු
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්
  - ආර්ථික සහ මිල ස්ථායීතාව
    - මුදල් සහ බැංකු
    - මුදල් ප්‍රතිපත්තිය
  - මූල්‍ය පද්ධති ස්ථායීතා ප්‍රතිපත්තිය
  - වෙනත්/නියෝජිත කාර්යයන්
- ශ්‍රී ලංකාවේ ව්‍යවසායක සංවර්ධන ක්‍රියාවලියේ මෑතකාලීන ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ පසුබිම, ඉතිහාසය, විකාශනය, අරමුණු සහ කාර්යයන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉතිහාසය

- එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත ක්‍රමයේ ආර්ථික විද්‍යාඥ ජෝන් එක්ස්ටර් මහතා විසින් ශ්‍රී ලංකාවේ මහ බැංකුව පිහිටුවීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදුන් අතර, කෙටුම්පතක් සමග ‘එක්ස්ටර් වාර්තාව’ ඉදිරිපත් කරන ලදී.
- මහ බැංකුව පිහිටුවීම සඳහා වන කෙටුම්පත 1949 අංක 58 දරණ මුදල් නීති පනත (Monetary Law Act) ලෙස සම්මත විය.
- 1950 අගෝස්තු 28 වන දින මහ බැංකුවේ කටයුතු ආරම්භ විය.
- 1985 දී එහි නාමය ‘ශ්‍රී ලංකා මහ බැංකුව’ (Central Bank of Sri Lanka) ලෙස වෙනස් කරන ලදී.

Simes Building (1950 -1955)

Hemas Building (1955-1964)



ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම මූල්‍ය ආයතනය වේ

- ශ්‍රී ලංකා මහ බැංකුව පාලනය කරනුයේ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලය මගිනි.

- එහි සාමාජිකයන් වන්නේ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, භාණ්ඩාගාර ලේකම් සහ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු: 2002 ට පෙර

2002 ට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බහුවිධ අරමුණු පැවතුණි.

- දේශීය මුදලේ අගය ස්ථාවර කිරීම
- දේශීය මුදලේ විදේශ අගය ආරක්ෂා කිරීම

ස්ථායීකරණ අරමුණු

- නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ මූර්ත ආදායම වැඩිකිරීම දිරිගැන්වීම
- රටේ නිෂ්පාදන සම්පත් සංවර්ධනය දිරිගැන්වීම

සංවර්ධන අරමුණු

වර්තමාන ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු

- ආර්ථික සහ මිල ස්ථායීතාව
- මූල්‍ය පද්ධති ස්ථායීතාව

ආර්ථික සහ මිල ස්ථායීතාව

- **මිල ස්ථායීතාව යනු සමස්ත මිල මට්ටමේ වෙනස්වීම අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමයි.**

- **ආර්ථිකයෙහි සමස්ත මිල මට්ටම ඉහළ යෑම නැතහොත් උද්ධමනය ආර්ථිකයට අහිතකර වේ.**

  - ✓ ජීවන වියදම ඉහළ යෑම සහ ජීවන තත්ත්වය පහත වැටීම නිසා අඩු සහ ස්ථාවර ආදායම් ලබන්නන්ට එය අහිතකර වීම
  - ✓ ඉතිරිකිරීම් හා ආයෝජන අධෛර්යවත් වී ආර්ථික වර්ධනයට අයහපත් බලපෑමක් ඇති වීම
  - ✓ ගෙවීම් මාධ්‍යයක් ලෙස මුදලට ඇති පිළිගැනීම අඩු වීම
  - ✓ සාපේක්ෂ මිල වෙනස්වීම් හඳුනා ගැනීම අපහසු නිසා සම්පත් බෙදාහැරීම අකාර්යක්ෂම වීම
  - ✓ විනිමය අනුපාතය අවප්‍රමාණය වීම හෝ වෙළෙඳ ශේෂය පිරිහීම

ආර්ථික සහ මිල ස්ථායීතාව

- **උද්ධමනය මෙන්ම අවධමනය ද ආර්ථිකයට අහිතකර වේ.**
  - ✓ අවධමනය භාණ්ඩ හා සේවා නිෂ්පාදන අධෛර්යවත් කර ආර්ථික අවපාතයක් ඇති කරයි.
  - ✓ සේවා වියුක්තිය ඉහළ යයි.
- **උද්ධමනය හෝ අවධමනය තුළින් ඇතිවිය හැකි අයහපත් ආර්ථික බලපෑම් දුරැලීම සඳහා මිල ස්ථායීතාව වැදගත් වේ.**
- **තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට ද මිල ස්ථායීතාව අත්‍යවශ්‍ය වේ.**
- **මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා මහ බැංකුව <u>මුදල් ප්‍රතිපත්තිය</u> ක්‍රියාත්මක කරයි.**

මූල්‍ය පද්ධති ස්ථායීතාව

- මූල්‍ය පද්ධති ස්ථායීතාව යනු <u>දේශීය හෝ විදේශීය වශයෙන් ඇතිවිය හැකි කම්පනවලට මුහුණ දී නොසැලී සිටීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාවයි.</u>
- මූල්‍ය පද්ධතියේ සිදුවන වෙනසකදී එයින් සාර්ව ආර්ථිකයට බලපෑමක් නොවන්නේ නම් එය ස්ථායී මූල්‍ය පද්ධතියක් ලෙස හැඳින්වේ.
- මිල ස්ථායීතාව ළඟාකර ගැනීම සඳහා මූල්‍ය අතරමැදියන් හරහා මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කිරීම සිදුවේ.
- මෙම අරමුණු දෙක එකිනෙක සම්බන්ධවන අතර, එකිනෙක අනුපූරණය වේ.

මුදල් සහ බැංකු

මුදල්

- මුදල් යනු භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගනු ලබන ඕනෑම මාධ්‍යයකි.





මුදලේ කාර්යයන්

- විනිමය මාධ්‍යයක් වීම
- වටිනාකම පිළිබඳ මිනුමක් වීම
- වටිනාකමේ සන්නිධියක් වීම
- විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම

මුදල් ඉල්ලුම

ගනුදෙනු චේතනාව

ආරක්ෂණ චේතනාව

සමපේක්ෂණ චේතනාව

මුදල් සැපයුම

රටක යම් නිශ්චිත අවස්ථාවකදී මහජනයා වෙත ඇති සමස්ත මුදල් තොගය මුදල් සැපයුම වේ.



මුදල් සැපයුමේ විවිධ ප්‍රභේද

M_0	• පදනම් මුදල්
M_1	• පටු මුදල්
M_2	• පුළුල් මුදල්
M_{2b}	• පුළුල් මුදල්
M_4	• පුළුල් මුදල්

පදනම් මුදල් සැපයුමේ ප්‍රභවයන්



පදනම් මුදල්වල සංයුතිය හා එහි ප්‍රභවයන් මහ බැංකුවේ ශේෂ පත්‍රය තුළින් හඳුනා ගත හැක

මහ බැංකුවේ ශේෂ පත්‍රය (2021 දෙසැම්බර් 31 දිනට)

වගකීම්		වත්කම්	
	රුපියල් බිලියන		රුපියල් බිලියන
සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්	1,005.0	මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්	763.6
වාණිජ බැංකු රාජ්‍ය නියෝජිත ආයතන සතුව මහ බැංකුවේ ඇති ගිණුම් ශේෂ	1,577.6	මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්	2,221.8
හිමිකරු ප්‍රාග්ධනය	463.6		60.8
සමස්ත වගකීම්	**3,046.2**	**සමස්ත වත්කම්**	**3,046.2**

මූල්‍ය වෙළෙඳපොළ

- ආර්ථිකයක මූල්‍ය වෙළෙඳපොළ, අතිරික්ත අරමුදල් සහිත පුද්ගලයන්ගෙන්, අරමුදල් හිඟයක් ඇති පුද්ගලයන් වෙත අරමුදල් ලබාදීමට උපකාරී වෙයි.
- අරමුදල් ආයෝජනය කිරීමෙන් ඉහළ ආර්ථික වර්ධනයක් ඇතිවන නිසා මූල්‍ය වෙළෙඳපොළ ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
- එමෙන්ම, අතිරික්ත අරමුදල් සහිත පුද්ගලයන්හට ඒ සඳහා පොලී ප්‍රතිලාභ ලබාගත හැකි වෙයි.

මූල්‍ය වෙළෙඳපොළේ ප්‍රධාන මූල්‍ය ආයතන

1. මහ බැංකුව
2. බලපත්‍රලාභී වාණිජ බැංකු - (24)
3. බලපත්‍රලාභී විශේෂිත බැංකු - (06)
4. බලපත්‍රලාභී මූදල් සමාගම් - (36)
5. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් - (03)

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්

මූල්‍ය පද්ධති ස්ථායීතාව

මූල්‍ය පද්ධති ස්ථායීතාව

- ස්ථාවර මූල්‍ය පද්ධතියක වැදගත්කම:
  - ඉතුරුම් සඳහා විශ්වාසය ඇති කිරීමට
  - මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට
  - කාර්යක්ෂම මුදල් අතරමැදිකරණය
  - සම්පත් කාර්යක්ෂම අයුරින් බෙදී යාමට

මූල්‍ය පද්ධති ස්ථායීතාව සඳහා මහ බැංකුවේ කාර්යභාරය

- මූල්‍ය පද්ධති අධීක්ෂණය කිරීම
- බැංකුවල බැංකුව වශයෙන් ක්‍රියා කිරීම
- ව්‍යවහාර මුදල් නිකුත් කිරීම
- ගෙවීම් සහ පියවීම් පද්ධතිය දියුණු කිරීම
- විදේශ සංචිත කළමනාකරණය

මූල්‍ය පද්ධති අධීක්ෂණය කිරීම

- ඇතිවිය හැකි අවදානම් සහ අවදානමට ලක්විය හැකි අංශ පිළිබඳව තක්සේරු කර මූල්‍ය පද්ධතියේ ශක්තිමත්භාවය තහවුරු කිරීමේ වගකීම මහ බැංකුව විසින් දරයි.

මූල්‍ය පද්ධති අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව :-

- තැන්පත්කරුවන්ට සහ ආයෝජකයන් හට හිතකර වාතාවරණයක් ඇති කිරීම
- මූල්‍ය පද්ධතියේ අතරමැදියෙකු ලෙස මූල්‍ය ආයතනවල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම
- මූල්‍ය වෙළෙඳපොළවල් ඵලදායී ලෙස ක්‍රියාකිරීමට සැලසීම
- රැකියා අවස්ථා සහ ආර්ථික වර්ධනය දිරිගැන්වීම

බැංකුකරුවන්ගේ බැංකුව ලෙස කටයුතු කිරීම

- වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් සඳහා ගෙවීම් සහ පියවීම් පහසුකම් සැලසීම සඳහා ඇති වගකීම, **RTGS** පද්ධතිය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරේ.
- නොයෙක් ගෙවීම් සඳහා චෙක්පත්, බැංකු අණකර සහ අනෙකුත් මුදල් හුවමාරු නිෂ්කාශනය සඳහා පහසුකම් මෙමගින් සපයනු ලැබේ.
- වාණිජ බැංකු සඳහා අවශ්‍ය තාවකාලික ද්‍රවශීලතා පහසුකම් සැපයීම.
- අවසන් ණය දෙන්නා වශයෙන් කටයුතු කිරීම **(Lender of Last Resort).**
- අතිරික්ත මුදල් සඳහා කෙටිකාලීන ආයෝජන පහසුකම් සැපයීම.

ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

- ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ එකම අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුවයි.
- ගනුදෙනු සඳහා වන මුදල්, ඒ සඳහා ඇති ඉල්ලුම මූලිකව පදනම් කරගෙන මුදල් නිකුත් කිරීම කරනු ලැබේ.
- 2021 වසර අග වන විට සංසරණයෙහි පැවැති මුදල් නෝට්ටු සහ කාසිවල මුළු වටිනාකම රුපියල් බිලියන 1005 ක් වේ.
- 2021 මුළු මුදල් වටිනාකමෙන් 98% ක් මුදල් නෝට්ටුවලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිත කාර්යයන්

- සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය සහ පරිපාලනය
- රාජ්‍ය ණය කළමනාකරණය
- ක්ෂුද්‍ර මූල්‍ය සහ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමවල ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීම මගින් ප්‍රාදේශීය සංවර්ධනය දිරිමත් කිරීම
- විනිමය පාලනය

ශ්‍රී ලංකාවේ ව්‍යවසායක සංවර්ධන ක්‍රියාවලියේ මෑතකාලීන ප්‍රවණතා

කඩිනම් සංවර්ධනයක ඇති අවශ්‍යතාවය

- අපි කිව්වේ දියුණුවෙමින් පවතින රටක් කියල

- මේ ව්‍යසනයත් සමග

- ආර්ථික වර්ධන වේගය
- 2019 – 2.3%
- 2020 – සෘණ 3.6%
- 2021 - 3.66%

ඇයි අපි දුප්පත්



දිළිඳු බවේ විෂම චක්‍රය



තමා ඇතුලු පවුලේ සාමාජිකයන්ට, වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා ගැනීම සඳහා

- මුදල් ඉපයීම පිළිබඳ දැනුම
- වියදම් කිරීම පිළිබඳ දැනුම
- ඉතිරි කිරීම පිළිබඳ දැනුම
- ආයෝජනය කිරීම පිළිබඳ දැනුම

මූලික බැංකු කටයුතු පිළිබඳ දැනුමකින් යුතු පුද්ගලයා

- තමන්ගේ ආදායම් සීමාව ඇතුලත වියදම් පාලනය කර ගනී.
- ආදායම් උපයන අතරම අනාගතය සඳහා ක්‍රමවත් මූල්‍ය සැලසුමක් පිළියෙල කර ගනී.
  (අනාගතය වෙනුවෙන් ඉතිරි කරයි)
- තමන්ගේ දේපල වත්කම් වර්ධනය කර ගනී.

ඔබේ සිහිනය කුමක්ද?

- මූලික බැංකු කටයුතු පිළිබඳ දැනුම කින් යුතු පුද්ගලයා අනාගතය කල් ඇතිව දකී.

එසේනම්....

කඩිනම් තිරසාර (sustainable) ව්‍යවසායකය සංවර්ධනයක ඇති අවශ්‍යතාවය

ශ්‍රී ලංකා මහ බැංකුව ගෙන ඇති පියවර....

ව්‍යවසායකය සංවර්දනයේ ඇති සීමාකම්

- මූල්‍ය සාක්ෂරතාවය - මූල්‍ය සාක්ෂරතාව තිබෙන මදකම නැතහොත් නැතිකම විශේෂයෙන් තරුණ ප්‍රජාව තුළ
- මූල්‍ය සාක්ෂරතාවයට මූල්‍ය පද්ධතිය තුල නිසි පිළිගැනීමක් නොමැතිකම / පිළිනොගැනීම
- ව්‍යවසායකයන් තුළ පවතින දූර්මත එහෙම නැත්නම් වැරදි ආකල්පයන්
- ව්‍යවසායක අධීක්ෂණය / ණය අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම

ව්‍යවසායකය සංවර්ධනයේ ඇති සීමාකම් .....

- බැංකු පද්ධතියෙන් ව්‍යවසායකයන වෙත ලැබෙන සහයෝගය - විශේෂයෙන් බැංකු සේවාවන් **(Banking Products)** තෝරාගැනීම
- ජාතික ප්‍රතිපත්ති වල ප්‍රමාණාත්මක වෙනස්කම්

මූලය සාක්ෂරතාවය

අපූරු වෙළෙඳ දැන්වීමක්

- මැණිකක් ලැබෙන්න ගොඩක් ලොකු වාසනාවක් තියෙන්න ඕන
- මැණිකට හොඳ මිලක් ලැබෙන්න තවත් ගොඩක් ලොකු වාසනාවක් තියෙන්න ඕන

මූල්‍ය සාක්ෂරතාවය

අපි මහබැංකු විදිහට තවත් එහාට යනවා

- ඔබට මුදල් ලැබුණත් ඒක වියදම් කරන්න ඊටත් වඩා ලොකු වාසනාවක් තියෙන්න ඕන

මොකක්ද මේ වියදම් කරන්න අවශ්‍ය දැනුම

මූල්‍ය සාක්ෂරතාවය

හොඳ මූල්‍ය තීරණ ගැනීමට සහ අවසානයේදී පුද්ගලයන්ගේ මූල්‍යමය යහපැවැත්ම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දැනුවත්භාවය, දැනුම, කුසලතා, ආකල්ප හා හැසිරීම් වල එකතුවකි.

A combination of awareness, knowledge, skill, attitude and behaviour necessary to make sound financial decisions and ultimately achieve individual financial wellbeing.

මූල්‍ය සාක්ෂරතාව තිබෙන මදකම නැතහොත් නැතිකම

- උදාහරණ -
- විශේෂයෙන් තරුණ ප්‍රජාව තුළ, පාසල් පද්ධතිය තුල, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තුල
- ඔවුන්ට අනුව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඇති ධනය ණය පමණයි
- බැංකු පුරුදු පිලිබද ඇති නොදැනුවත් භාවය
- පොලිය කියන සාදකය හදුනා ගන්නට ඇති නොහැකියාව

ව්‍යවසායක අධීක්ෂණය / ණය අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම

- ව්‍යවසායක අධීක්ෂණයක් / ණය අධීක්ෂණයක් අවශ්‍ය වන්නේ ඇයි ?
  - ණය මුදල් නිසියුරින් භාවිතා කර නොතිබීම.
  - දරුණු ලෙස ණය උගුල් වලට හසුවී සිටිම.
  - සමහරක් බැංකු ආයතන මගින් ණය ලබාදීමේදී සිදුකරන වැරදි
  - උදාහරණ කොටසින් කොටස සිදුකලයුතු ව්‍යාපෘතියක පවා ණය මුදල එකවර මුදා හැරීම යන්ත්‍ර මිලදී ගැනීමකදී අදාල සැපයුම්කරුගේ නමට චෙක්පත ලබා නොදීම

ස්තූතියි